# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

# නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 12 වන කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවීම

පූර්වෝක්ත එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම පිණිස 2022 ජූනි 20 දක්වා අයදුම්පත් භාරගනු ලැබේ. මෙම පාඨමාලාවට අදාළ දේශන ඉරිදා දිනවල සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්** : පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය

**පාඨමාලා ගාස්තු** : රු. 80,000.00 (මීට ආපසු ගෙවනු ලබන රු. 5,000.00/= ක පුස්තකාල ගාස්තුවක් ද ඇතුළත්ය.) පාඨමාලා ගාස්තු රු. 50,000/= සහ රු. 30,000.00/= බැගින් වූ වාරික දෙකකින් ගෙවිය හැකිය.

**අයදුම් කරන ආකාරය**

අයදුම් කිරීම සඳහා https://fgs.kln.ac.lk මගින් (online) අයදුම්පත්‍රය සම්පූර්ණ කර, මුද්‍රිත රිසිට්පත සමග පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කළ යුතුය. ඔබට අවශ්‍ය නම්, අයදුම්පත අන්තර්ජාලය මගින් ඇතුළත් කළ පසු ණය පත් (Credit Card) හරහා ද රු. 1,000/= ක අයදුම්පත් ගාස්තුව ගෙවිය හැකිය.

**හෝ**

අයදුම්පත් කැලණිය විශ්වවිද්‍යාලයේ නම වෙබ් අඩවියෙන් (https://fgs.kln.ac.lk) ද ලබාගත හැකිය. එසේ ලබාගත් අයදුම්පත් පුරවා රු. 1,000/= අයදුම් කිරීමේ ගාස්තුවක් කැලණිය මහජන බැංකුවේ අංක 055-1-001-8066-9229 දරන කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැරවන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් බැංකු රිසිට්පත සමග අයදුම්පත පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත යොමු කළ හැකිය.

**හෝ**

මහජන බැංකුවේ ඉහත ගිණුම් අංකයට රු. 1,000/= ක මුදලක් ගෙවූ බැංකු රිසිට්පතක් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත පැමිණ ඉදිරිපත් කිරීමෙන් ද අයදුම්පත් ලබාගත හැක.

- උක්ත පාඨමාලා අයදුම්පත් යොමු කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත පැමිණ හෝ පහත ලිපිනයට තැපැල් කිරීමෙන් ද කළ හැකිය.

| | |
|---|---|
| ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව" ලෙස සඳහන් කරන්න. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. |

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2022.06.20**

**ලේඛකාධිකාරී,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**කැලණිය.**